heads of departments should keep in mind of the availability of qualified staff to undertake teaching.

There are some points worthy of the attention of the young graduates who are passing out today. Having received your education at the university, are you entering the world of the adult population with self confidence and courage? Are you at the employment bureau with the necessary qualifications? Was the education that you received at the university of any benefit to you? Do you have the courage to face the numerous trials and tribulations which await your arrival in the outside world? Are you sufficiently courageous at times of trial to accept defeat with a smiling face? In the event of being victorious is it possible for you to adopt in indifferent attitude?

It is to your advantage to keep in mind the above questions and have the necessary answers ready for your own future guidance. I am most anxious to repeat that the first and foremost aim of education at university level is to produce young people who can be of service to the country. The answers to the questions asked above depend on the type of education that the university has given to the student body. Lessons taught in classes and the academic environment within the university should bring about the maturity of a student to face the burning questions of the out side world. Our university should produce a young and brave generation that can be of service to our country and to the nation at large and about whom we can be proud of.

# 17

# විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳ විමසුමක්

*මහාචාර්ය නන්දසේන මුදියන්සේ*

විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා ගැනීමේ පරමාර්ථය කුමක් ද යනු අප විසින් අවශ්‍යයෙන් සලකා බැලිය යුතු කරුණකි. මේ සඳහා පිළිතුරු දිය යුත්තේ මීට අවුරුදු සියයකට පමණ පෙර ලෝකයේ පැවති සමාජ තත්ත්වය අනුව නො වෙයි. අධ්‍යාපන තත්ත්වය උසස් කර ගනු ලබන්නේ පර්යේෂණ කරා සිත් යොමු කර ගැනීම ආදී උත්තරීතර අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීම සඳහා බව එකල පැවති මතයයි. අතීතයේ පැවති එබඳු ආකල්ප නූතන ලෝකයේ සමාජ තත්ත්වයන් හා නොගැළපේ. වැඩි වශයෙන් දුගී ජනතාවක් වාස භූමිය කර ගත් ලංකාව වැනි රටක එබඳු තත්ත්වයක් බලාපොරොත්තු විය නොහැක.

එසේ වුවත් එම ආකල්ප සම්පූර්ණයෙන් ඉවත ලා සිටීම ද යෝග්‍ය නො වේ. ඒවා කාලානුරූප ව වර්තමාන සමාජ තත්ත්වයන්ට අනුව ගළපා ගැනීම අවශ්‍යයෙන් සිදු කළ යුත්තකි. අපේ සමාජය මෙකල පවත්නේ මීට අවුරුදු සියයකට පූර්වයෙන් පැවති ආකාරයෙන් නොවන බව අප කවුරුත් දන්නා කරුණකි. එදා පැවති සමාජීය හා ආර්ථික ජීවන රටාව බලවත් වෙනස්කම්වලට භාජනය වී ඇති බැවින් පාඨශාලීය සැලසුම් වුව ද සියයට සියයක් ම වෙනස්කම්වලින් යුතුව පරිණාමය වී ඇත. ලන්ඩන් විශ්වවිද්‍යාලයට සම්බන්ධ කර වෂී 1921 දී පමණ ලංකාවේ පිහිටුවනු ලැබුවේ ලන්ඩන් විශ්වවිද්‍යාලයට අනුබද්ධ කළ ආයතනයකි. එමගින් එහි විභාග සඳහා ශිෂ්‍යයන් ගණනාවක් පුහුණු කරවන ලදි. එම ආයතනයේ ප්‍රධානියා වශයෙන් බොහෝ කාලයක් සේවය කළේ මහාචාර්ය ආර්. මාර්ස් මහතාය. ඒ කාලයේ අධ්‍යාපනය ලැබූ ශිෂ්‍යයන්ගෙන් වැඩි දෙනා අද ජීවතුන් අතර සිටී ද යනු සැක සහිතය. ලන්ඩන් විභාගවලට ශිෂ්‍යයන් පුහුණු කරවීම නවත්වා, ස්වාධීන විශ්වවිද්‍යාලයක් පිහිටුවිය යුතු යයි එකල පැවති ව්‍යවස්ථාදායක හා රාජ්‍යමන්ත්‍රණ සභා ආදියේ දී යෝජනා ඉදිරිපත් වී අනුමත වූයෙන් 1942 දී පමණ සර් අයිවර් ජෙනිංග්ස් මහතා උපකුලපති වශයෙන් පත් කරනු ලැබ ලංකා විශ්වවිද්‍යාලය ආරම්භ කරනු ලැබීය. ඒ හේතුවෙන් ලන්ඩන් විභාගවලට ශිෂ්‍යයන් ඉදිරිපත් වීම තරමක් දුරට අඩු වූ නමුත් පුද්ගලික අපේක්ෂකයන් වශයෙන් එම විභාගවලට බාහිර ව පෙනී සිටීම නොකඩවා සිදු විය.

1942 දී පිහිටුවනු ලැබුවේ එක ම විශ්වවිද්‍යාලයක් වුව ද අද එබඳු ආයතන 17ක් ඇති බව වාර්තාගත ව ඇත. මේවායින් උපාධි ලබන

තරුණ තරුණියන් සඳහා ඇත්තේ කුමන ආකාරයේ අනාගතයක් ද? රැකියා නොමැති ව ළතැවෙන උපාධිධාරීන්ගේ සංඛ්‍යාව දහස් ගණනක් බව පුවත්පත් වාර්තාවලින් කියවේ. අප රටේ පාඨශාලාවලින් හා විශ්වවිද්‍යාලවලින් බිහි කළ යුත්තේ මේ රටේ ධන සම්පත වැඩි දියුණු කළ හැකි පිරිසක් විය යුතුය. විශ්වවිද්‍යාල අධ්‍යාපන කටයුතු සකස් කිරීමෙහි නියුතු විද්වතුන් විසින් අවශ්‍යයෙන් ම සලකා බැලිය යුත්තේ, අප රටේ පවත්නා, යටත් විජිත සමයෙන් උරුම වූ ආර්ථික රටාව, අපේ ජනතාවගේ සෞභාග්‍යය සඳහා ක්‍රමානුකූල ව සංවිධානය කළ යුතු ආකාරයයි.

විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳ පාරම්පරික ආකල්පවල සාරය වූයේ ඥානය වර්ධනය කරලීම සහ එමගින් රටක ආර්ථික, සාමාජික හා සංස්කෘතික වටිනාකම් කාලානුරූප ව වර්ධනය කිරීමයි. ඥානය දියුණු කර ගත යුත්තේ හුදෙක් ඒ සඳහා කැපවීමකින් යුතුවය. මෙම පාරම්පරික සංකල්පය අද ලෝකයේ සමාජ ප්‍රශ්න හා සමකර බලමින් ඒවා වත්මනට ගැළපෙන අයුරින් සකස් කර ගත යුතු බව අප විසින් සාවධානව සලකා බැලිය යුතු බව අපගේ හැඟීමයි. විවිධ විෂයන් පිළිබඳ එක්තරා ප්‍රමාණයක දැනීමක් ඇති ව තිබීම අතිශයින් ම වැඩදායකය. දැනීම ලබාගැනීම යනු ඒ සඳහා කැපවීමකින් කළ යුතු දෙයකි. විශ්වවිද්‍යාලවලට සම්බන්ධ ආචාර්ය භවතුන් තම තමන්ගේ දැනීම් සම්භාරය එකිනෙකා අතර හුවමාරු කර ගැනීම මෙන් ම ඒ සඳහා අවශ්‍ය පරිසරය ද සකස් කර ගත යුතු වේ.

විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් මගින් උපාධි අපේක්ෂකයකුට අත් කර දිය යුතු කරුණු කිහිපයක් ගැන අවධානය යොමු කරනු කැමැත්තෙමි. පළමුවෙනිව එම අධ්‍යාපනය ලබන ශිෂ්‍යයා තමන් ඉගෙන ගන්නා විෂය පිළිබඳ පුළුල් දැනීමක් ලබා ගත යුතුයි. තමන් ලබා ගන්නා සහතිකය හෝ උපාධිය යනු එක් විෂයක් හෝ විෂය කිහිපයක් පිළිබඳ ව හොඳ දැනුමක් ඇති බවට සාක්ෂ්‍යයකි. එසේ නොවේ නම්, එම සහතිකය වටිනාකමක් ඇති දෙයක් නො වේ. විශ්වවිද්‍යාල අධ්‍යාපනය මගින් ඉටුවිය යුතු අත්‍යවශ්‍ය කාර්යයන් සිදු නොවූ බව එයින් නිගමනය කළ හැකිය. එබඳු පුද්ගලයකු ගැන පිටස්තර ලෝකයා ඇති කර ගනු ලබන්නේ ඒ තැනැත්තා තමාගේ ප්‍රදේශයට හා රටට අනවශ්‍ය තැනැත්තෙකුය යන හැඟීමකි. ඔහු ඉගෙනීම ලැබූ විශ්වවිද්‍යාලයට එය බලවත් අපකීර්තියකි. දෙවෙනි ව තමන් ඉගෙනීම අවසන් කර උපාධියක් ලබා ගත් පසු ලෝකය දෙස බලන ආකාරය විද්‍යාඥයකුගේ විලාසය විය යුතුය. තමන් ඉදිරියට පැමිණෙන හෝ පමුණුවනු ලබන ප්‍රශ්න නිරවුල් ව සලකා බැලීමට හැකිවීම සහ ඒවා ක්‍රමානුකූල ව තෝරා බේරා ගැනීමට අවශ්‍ය මානසික ශක්තිය ඇති වීම ඉතා අවශ්‍ය කරුණුයි. විමර්ශන බුද්ධිය, ප්‍රශ්නයක සුලමුල සාර්ථක ව සොයා බැලීමේ හැකියාව සහ තම ඥාන සම්භාරය තව දුරටත් දියුණු කර ගැනීමේ ආශාව ඇති වීම යන මෙම අවශ්‍යතා විශ්වවිද්‍යාල උපාධිධරයකු තුළ



අවශ්‍යයෙන් ම තිබිය යුතු තත්ත්වයකි. තමාගේ විශේෂ දස්කම් තම විෂයට පමණක් සීමා නොකර, සමාජයේ තිබෙන වැදගත් ප්‍රශ්න හඳුනාගෙන ඒවාට නිරවුල් හා සාර්ථක විසඳුම් සොයා ගැනීමේ ශක්තිය ද විශ්වවිද්‍යාල උපාධිධරයකු තුළ තිබිය යුතුය. අපේ රටේ අනාගත නායකයෝ නම් විශ්වවිද්‍යාලවලින් බිහි කෙරෙන උපාධිධරයෝය.

තුන්වෙනි ව දැනීම ලබාගත් පසු තමා කෙරෙහි නිහතමානී බවක් ඇතිවීම අත්‍යවශ්‍යයි. මන්ද තමන් දැනගෙන ඇත්තේ කෙළවරක් නැති ඥාන සම්භාරයක අංශුමාත්‍රයක් පමණක් බව තමා විසින් වටහාගත යුතු ව ඇත. මේ හේතුවෙන් තමන්ට තව දුරටත් තමන් දන්නා දෙයට අමතර ව නොදත් විෂයන් ගැන සොයා බැලීමේ උනන්දුවක් ඇතිවීම සිදු වනු ඇත. තමන් දන්නා දෙය වැඩි දියුණු කර ගැනීමේ ආශාවක් ඇති වේ නම් ඒ ගැන සැලකිලිමත් වීම හිතකරය. ඔබේ ශක්තීන් තව දුරටත් වර්ධනය වී යම් යම් අවස්ථාවල දී නොසැලී එය ප්‍රීතියෙන් භාර ගැනීම, සාමුහික ව පොදු ජනතාවට හිතකර ව්‍යාපාරවල දී සහයෝගය දැක්වීම, තමන් ජීවත් වන සමාජය තව දුරටත් ශක්තිමත් කර වර්ධනය කරලීමේ උද්‍යෝගය ආදී උසස් මනුෂ්‍ය ගති ඔබ කෙරෙහි පැවතිය යුතුය. ඔබ ලැබූ විශ්වවිද්‍යාල අධ්‍යාපනය නිසා ඔබගේ පෞරුෂත්වය ඉතා ඉහළ මට්ටමක පැවතීම අත්‍යවශ්‍යය. අපේ සමාජයෙහි ඉතා දුර්ලභව දක්නට ලැබෙන අවංකකම සහ නිර්ව්‍යාජත්වය, ඔබේ ජීවිතය ඉදිරියට ගෙන යාමේ දී ඔබ විසින් හසුරුවනු ලබන වැදගත් ගුණාංග විය යුතුය.

අතීතයේ මෙන් ම වර්තමාන කාලයේ ද අපේ සමාජයේ සංස්කෘතික ලක්ෂණයක් නම්, දැනීම ලබා ගැනීමට අමුතු ආශාවක් තිබීම සහ දැනමුතුකම් සහිත අයට ගෞරවාදර දැක්වීමේ පිළිවෙළයි. පරම්පරාගත ව එන මේ ලක්ෂණ ඉතා වටිනා දායාද වශයෙන් සලකමු. ඒ නිසා ඒවා වැඩියෙන් පෝෂණය කරමින් ඉදිරියට ද ගෙන යා යුතු බව අනිවාර්යයෙන් ම සඳහන් කළ යුතු වේ. ලබාගැනීම යනු කරුණු නොහොත් දත්ත එක්රැස් කරමින් සිත්හි තැන්පත් කර ගැනීම පමණක් නො වේ. තමන් දන්නා කරුණු විස්තර වශයෙන් විභාග කරමින් පරීක්ෂකවරයකුගේ තත්ත්වයට පැමිණීම ඒ අනුසාරයෙන් සිදු විය යුතුය. අපේ උපාධිධරයන් විචාරාත්මක වී, අවස්ථාවන්ට ගැළපෙන පරිදි නායකත්වය ගෙන ඉදිරියට යාමේ හැකියාවන් සහිත වීම වැදගත් ය.

විශ්වවිද්‍යාල අධ්‍යාපනයකින් ලද හැකි මෙකී සම්පත්, කථිකාචාර්යවරුන් විසින් පවත්වනු ලබන දේශන හා වාර්ෂික පරීක්ෂණ ආදිය මගින් පමණක් සාක්ෂාත් කරගත නොහැක. උපාධි අපේක්ෂකයන් විසින් ප්‍රගුණ කරගත යුතු ගුණාංග, විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් මගින් බලාපොරොත්තු විය හැකි පරමාර්ථ සර්වප්‍රකාරයෙන් සපුරාලන්නේ නො වේ. වෙනත් උපාය මාර්ගවලින්, එනම් ක්‍රීඩාවල නිරතවීම, චිත්‍රපටි ආදිය බැලීමට සිත් යොමුවීම, ශිෂ්‍ය සංගම්වලට බැඳී ඒ රැස්වීම්වලට

සහභාගිවීම, බාහිර කථීකයන් ලවා පවත්වා ගනු ලබන දේශනවලට සවන් දීම ආදී මෙහි දී සඳහන් නොකළ අනෙක් උත්කෘෂ්ට කාර්යයන්ට සම්බන්ධ වීමෙන්, විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් ලැබිය හැකි පුළුල් අභිප්‍රායයන් ඉෂ්ට කර ගත හැකි වෙයි.

යමෙකු විශ්වවිද්‍යාලයකින් උපාධි ලබා පිටත් වූ විට, ඔහු උසස් බුද්ධිමතෙකිය යනුවෙන් සාමාන්‍ය පිළිගැනීමක් ඇත. එම පිළිගැනීම මහජනතාව අතර තව දුරටත් තහවුරු වන සේ ක්‍රියාවට නැඟීම උපාධිධරයකුගේ අභිමතාර්ථය විය යුතු ය. මෙහි දී සිහියේ තබා ගත යුතු වැදගත් කාරණයක් වේ. "යම් යම් විෂයයන් මැනවින් හදාරා එයිනික්බිති ඒ උගත් කරුණු අමතක වී ගිය පසු යමක් මනසෙහි ඉතිරි වන්නේ නම් ඊට නම් කළ යුත්තේ සංස්කෘතිය යනුය" යන කියමනයි. (when facts have been studied and forgotten, what remains in the mind is culture).

අපේ විශ්වවිද්‍යාලවලින් දෙනු ලබන අධ්‍යාපනය විධිමත් කිරීම සඳහා, ඉහතින් සඳහන් කළ ආකාරයෙන් ක්‍රියාකාරකම් ඇති පමණ තිබේද? බොහෝ ශිෂ්‍යයන්, පන්ති කාමරවලට, දේශනවලට හා විභාගවලට සීමා වී සිටිනු මිස, බාහිර කටයුතුවලට යොමු වී ඇති ද? අපගේ අවංක හැඟීමට අනුව ඉතා ම පැරණි මෙන් ම නවීන විශ්වවිද්‍යාලවලත් හැම අතින් ම අංග සම්පූර්ණ අධ්‍යාපන ක්‍රමයක් සකස් වී නැතිවා මෙන් ම ඒ සඳහා විධිමත් පරිසරයක් නොමැති බව කිව හැකිය. ඉතා පුළුල් අධ්‍යාපනයක් ලබා දීමේ ක්‍රියාමාර්ගවලින් අපේ පැරණි ම විශ්වවිද්‍යාල පවා ඉවත් වී ඇති බව කණගාටුවෙන් වුව ද සඳහන් කළ යුතුය.

මීට හේතු සාධක වශයෙන් කාරණා කිහිපයක් ඉදිරිපත් කළ හැක. පාඨශාලාවල ඉගෙනීමේ කාලය තුළ දී විභාගවලට පෙනී සිටීම සඳහා අධික වියදම් හා වෙහෙස මහන්සි දරා සූදානම් කිරීම, වාර්ෂික හා වාර පරීක්ෂණ පැවැත්වීම සඳහා විශ්වවිද්‍යාල වැඩි උනන්දුවකින් ක්‍රියා කිරීම, රැකීරක්ෂාවල් සපයා ගැනීමේ අරමුණු සපුරාලීම සඳහා සුදුසු යයි සිතෙන පාඨශාලාවලට ඇතුළත් වීමට වෙර දැරීම, අඩු පහසුකම් සහිත ස්ථානවල සිට විශ්වවිද්‍යාල පාඨමාලා හැදෑරීම සඳහා පැමිණීමට සිදුවීම, විශ්වවිද්‍යාලවල ඇතුළත පවා ශිෂ්‍යයන්ට අත්‍යවශ්‍ය පහසුකම් නොමැතිවීම යනාදී කරුණු බොහෝ සෙයින් විශ්වවිද්‍යාල ශිෂ්‍ය අසහනයට හේතු වශයෙන් දැක්වේ. මේවායෙහි එක්තරා ප්‍රමාණයක සත්‍යභාවයක් නැත්තේ නො වේ. එම අඩුපාඩුකම් හැකි තරම් දුරට මඟහරවා ගැනීමට ක්‍රියා කිරීම අවශ්‍යය.

මෙකී උසස් අපේක්ෂාවන් මුදුන්පත් කර ගැනීමට බාධක වශයෙන් පවත්නා සමාජ ප්‍රශ්න ගණනාවකි. විශේෂයෙන් ආර්ථික බාධාවන් ඇතැයි අදහස් කරමින් ඒවා මඟ හැරීමට යොමු වන බව අප විසින් පිළිගත යුතු ය. ආර්ථික දුෂ්කරතා මෙන් ම ප්‍රවීණ ආචාර්යවරුන්ගේ හිඟය ද මඟ හරවාලීම අපහසු වුවත්, අපට පිළිවන් ආකාරයට අපේ ඇති සියලු ම උපායමාර්ග යොදා ගනිමින් අපේ අරමුණු සාර්ථක කර



ගැනීමට වෙහෙස විය යුතු බව අවධාරණයෙන් සඳහන් කිරීම මැනවි. ලංකාව වූ කලී ලෝකයේ ඇති ඉතා ම දුගී රටක් නිසා මෙබඳු අඩුපාඩුකම් ඇතිබව සලකා ගනිමින් ඒවා මඟ හරවා ගැනීමට උත්සාහ කිරීම ප්‍රඥාගෝචර වේ.

තව ද කිවයුතු කරුණක් නම්, ඉහත සඳහන් ප්‍රශ්න අප විසින් ම ඇති කර ගනු ලබන ඒවා බවයි. ප්‍රධාන වශයෙන් ඒවා සමාජ හා සංස්කෘතික යනුවෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකියි. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, විශ්වවිද්‍යාල පාලක මණ්ඩලය, ශිෂ්‍ය ප්‍රජාව යන සියලු දෙනා ම මෙම අභාග්‍යසම්පන්න තත්ත්වයට වග කිව යුතු වෙයි. විශ්වවිද්‍යාලයකින් ඉටු විය යුතු උසස් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම මෙකී අය මගින් සිදු විය යුතුය. එහෙත් එය එසේ සිදු වන්නේ නො වේ. ඔවුන් කෙරෙහි සාමූහික වගකීමක් නැති බව පැහැදිලි ව ම පෙනෙන්නට තිබෙන කරුණකි. මතු පරම්පරාව හැඩ ගැසෙනුයේ මෙකී අය කැපවීමකින් යුතු ව තම ආයතනවල ගරුත්වය රැක ගැනීමට උත්සාහවන්ත වුවහොත් පමණි. ආචාර්යවරුන්ගේ කාර්යය ඉගැන්වීම පමණක් නොව තම අධ්‍යයන ක්ෂේත්‍රයත් තවත් පුළුල් කර ගැනීම සඳහා වැඩිදුර ඉගෙනීමේ යෙදීමයි. ශිෂ්‍යයන්ගෙන් පවා ඉගෙනීම ලද හැකි බව බොහෝ දෙනා අමතක කරන කරුණකි. තමන්ගෙන් ප්‍රශ්න ඇසීමට ශිෂ්‍යයන් උනන්දු කරවීම මෙන් ම තමන් කියා දෙන දෙය ඔවුන් ලවා විවේචනය කරවා ගැනීම ද අනිවාර්යයෙන් සිදුවිය යුත්තකි. ඒ මගින් ආචාර්යවරයා පමණක් නොව ශිෂ්‍යයා ද ඉගෙන ගනී.

මීට අමතර ව සලකා බැලිය යුතු කරුණක් නම්, අපේ පරම්පරාගත විශ්වාසය වන ගුරුවරයා සෑම දෙය ම දැනගත් පුද්ගලයා යන හැඟීම බොහෝ දුරට ඉවත් කර ගැනීමයි. එම පැරණි ආකල්පය අනුව ගුරුවරයා සඳහන් කරන සියලු දෙය මෙන් ම ඔහුගේ අදහස් ද ශිෂ්‍යයා විසින් අනිවාර්යයෙන් පිළිගත යුතුයි. ඒ සම්ප්‍රදායට අනුව විවේචනයට අවකාශයක් නොමැත. මේ වූකලී පුරාතන අධ්‍යයන හා අධ්‍යාපන කාර්යයේ දී දක්නට ලැබුණු ඉතා අමනෝඥ, අවාසනාවන්ත තත්ත්වයකි. යමක හරි වැරදි සොයා බැලීමේ හැකියාව මේ මගින් දුබල වෙයි. විශ්වවිද්‍යාලයකින් ලැබිය යුතු අධ්‍යාපනය මීට වඩා සර්වප්‍රකාරයෙන් ම වෙනස් ය. ගුරු භක්තිය යනු විමංසනාත්මක ව ගත් කල ප්‍රශංසනීය වුවත්, අමනෝඥ ලෙස කරට ගත්විට අතිශයින් නින්ද්‍ය සහගත වෙයි.

ලන්ඩන් විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් වශයෙන් ලංකාවේ එවකට පැවති විශ්වවිද්‍යාල මණ්ඩපයෙහි සේවය කළ ආචාර්ය භවතුන්ගෙන් සමහරෙකු ශාස්ත්‍රීය ගවේෂණවලට මෙන්ම විවේචන ක්‍රමය අනුසාරයෙන් විවේක බුද්ධිය වර්ධනය කරලීමට මග පාදගත් බවට සාක්ෂ්‍යය ඉදිරිපත් කළ හැකිය. එම ආයතනයෙහි ප්‍රධානියා වශයෙන් සේවය කළ මහාචාර්ය ආර්. මාර්ස් මහතා එක් අවස්ථාවක දී තමා යටතේ ඉගෙනීම කළ ශිෂ්‍යයෙකුගේ ශාස්ත්‍රීය නිබන්ධයක් කියවා මෙසේ පවසා ඇත. "මම ඔබේ නිබන්ධය කිහිප වාරයක් කියවා බැලීමි.

එහි දැක්වෙන අදහස්වලට මගේ කිසි ම එකඟත්වයක් නැත. එසේ වුවත් ඔබේ විවේචන ක්‍රමය තව දුරටත් තියුණු කරලීමේ අදහසින් මම ඔබේ නිබන්ධනයට සියයට සියයක්ම ලකුණු දෙමි" මෙම ශිෂ්‍යයා පසුව ආර්ථික විද්‍යාව පිළිබඳ අවසාන පරීක්ෂණයෙන් ප්‍රථම පංතියේ ගෞරව සාමර්ථ්‍යයක් ලැබීය.

ලංකා විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රථම මහාචාර්යවරයා වූ ඊ.එෆ්.සී ලුඩොවයික් මහතා "ෂේක්ෂ්පියර් කවියා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම" (Understanding Shakespeare) යන මාතෘකාවෙන් යුතු ග්‍රන්ථයක් ලියා එය කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය මගින් ප්‍රසිද්ධ කරවීය. එහි පිළිගැන්වීමේ වාක්‍යවලින් කිහිපයක් නම්, "ෂේක්ස්පියර්ගේ ග්‍රන්ථ කියවා තේරුම් ගැනීමට මම ම බොහෝ උත්සාහවන්ත වීමි. අවුරුදු 25ක කාලයක් තුළ ඒවා ලංකා විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ට ඉගැන්වීමි. නොයෙක් අවස්ථාවල දී මගෙන් ප්‍රශ්න අසමින් මගේ විමර්ශන බුද්ධිය ආලෝකමත් කර ගැනීමට ශිෂ්‍යයින්ගෙන් සහයෝගය ලැබුණු නිසා කලින් අවබෝධ කර ගෙන තිබුණාට වඩා හොඳින් මට ෂේක්ස්පියර් හඳුනා ගැනීමට අවකාශ ලැබුණි. එහෙයින් කළගුණ සැලකීම් වශයෙන් මේ ග්‍රන්ථය එම ලංකා විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට පිළිගන්වමි" යනුයි.

ඉහත කී කරුණුවලට අමතර ව විශ්වවිද්‍යාල මගින් නාට්‍ය කලාවට සිදු වූ සේවාව ද ඇගැයිය යුතු වේ. 1947 දී ලංකාවට නිදහස ලැබුණු අවධියේ පවත්වා ගෙන ගිය ඉංග්‍රීසි පාසල්වල ඉංග්‍රීසි නාට්‍ය රඟදැක්විණි. එම ආධුනික රඟුම් ඉංග්‍රීසි උගත් ඉහළ මධ්‍යම පන්තිය විසින් රස විඳිනු ලැබීය. මහාචාර්ය ඊ.එෆ්.සී. ලුඩොවයික් මහතාගේ උපදේශකත්වයෙන් වසරකට වරක් (එකල පැවති විශ්වවිද්‍යාල මණ්ඩපයේ සිසුන් විසින් රඟ දක්වනු ලැබුයේ) බටහිර නාට්‍ය කිහිපයකි. මෝලියර්, බර්නාඩ් ෂෝ, ෂේක්ස්පියර් ආදීන් විසින් රචිත නාට්‍ය මේ සඳහා ඉවහල් විය. පේරාදෙණිය මණ්ඩපය බිහිවීමත් සමගම සිංහල නාට්‍යයන් රඟ දැක්වීමට ශිෂ්‍යයන් උනන්දු කරවීමට උත්සාහවන්ත වූයේ මහාචාර්ය ඊ.ආර්. සරච්චන්ද්‍ර මහතාය. ඉන්දියාවේ ශාන්ති නිකේතනය වෙත ගොස් අධ්‍යාපනය ලැබූ තරුණ පිරිස් කෙරෙහි ඉන්දියානු නිදහස් අරගලයේ ආභාසය ද ප්‍රකට ව දක්නට ලැබුණි. ඔවුන් ලංකාවට පැමිණ දේශීය කලා සම්ප්‍රදායක් ගොඩනැගීමෙහිලා උත්සාහවන්ත වූ බව මෙහි දී සඳහන් කළ යුතු වේ. 1940 දශකයේ දී මෝරා එමින් තිබූ මෙම ප්‍රවණතාව, නාට්‍ය ක්ෂේත්‍රයේ ප්‍රකාශ කිරීමට ඉදිරිපත් වූයේ සරත්චන්ද්‍ර මහතා බව, ඔහු විසින් 1952 දී රඟ දැක්වූ **පබාවතී** නාට්‍යයෙන් පෙනී යයි. සිංහල ගැමි නාටක ගැන ඔහු කළ පර්යේෂණයන් **ලංකාවේ ගැමි නාට්‍යය** (The Folk Drama of Ceylon) නම් කෘතියෙහි අඩංගු වී ඇත. **පබාවතී** නාට්‍යය සඳහා යොදා ගනු ලැබුවේ කුස ජාතකය මුල් කර ගත් කථාවකි. එය බටහිර රංග ශෛලිය අනුව නිර්මාණය කරන ලද නිසා එය යම් යම් විචාරකයන්ගේ දෝෂ දර්ශනයට ලක් විය.



ලංකාවට නිදහස ලැබුණු අවධියේ දී ඇතැම් විදේශීය උගතුන් ප්‍රකාශ කළේ මේ රට සංස්කෘතික කාන්තාරයක් බවය. එම ප්‍රකාශය කරන ලද කාලයේ දී එහි එක්තරා ප්‍රමාණයක සත්‍යයක් ගැබ් වී තිබුණු නමුත්, එම අදහස සිතට නඟාගත් අපේ යම් යම් විද්වත්හු, එනම් සරච්චන්ද්‍ර වැනි අය, සිංහල නාට්‍ය කලාවට නව මුහුණුවරක් දෙමින්, **මනමේ, කදා වළලු, පේමතෝ ජායතී සෝකෝ, හස්තිකාන්ත මන්තරේ, එලොව ගිහින් මෙලොව ආවා, වෙල්ලවැහුම්** ආදී නාට්‍ය ගණනාවක් තම සිසුන් ලවා පුහුණු කරවා රඟ දැක්වූහ. මනමේ නාට්‍යය වූ කලී සිංහල නාට්‍යවලින් ඉතා ම උසස් කෘතිය වශයෙන් සැලකීමේ වරදක් නැත. සරච්චන්ද්‍ර මුලින් ම නාට්‍ය ක්ෂේත්‍රයට පිවිසියේ ප්‍රංශ නාට්‍යවේදී මෝලියර්ගේ කෘතියක් ඇසුරින් **මුදලාලිගේ පෙරළිය** යනුවෙන් සකස් කළ නාට්‍යයක් රඟ දැක්වීමෙනි. එයින් ලත් පරිචය වැඩි දියුණු කරගත් හෙතෙම ලාංකික සංස්කෘතියට ගැළපෙන සුබනම්‍ය වූ රස විඳිය හැකි රංග රීතියක් සොයා ගැනීම වස් මහත් වෙහෙසක් ගති. ඒ සඳහා ඔහු ගම් නියම් ගම්වල සැරිසරමින්, කටුක ආහාරපානවලින් එදිනෙදා වේල පිරිමසමින්, ජන නාටක පිළිබඳ විවිධ පර්යේෂණවල නිරත විය. ඊට අමතර ව පිටරටවල පවා සංචාරයන්හි නිරත වූයේ විවිධ රංග රීති අධ්‍යයනය කිරීමටය. එම වෙහෙස මහන්සියේ ප්‍රතිඵලය වුයේ 1956 නොවැම්බර් මාසයේ දී **මනමේ** නාට්‍යය බිහි වීමය. නාට්‍යකරණය පිළිබඳ ව මෙහි දී සඳහනක් කිරීමට මා අදහස් කළේ, විදේශීය උගතුන්ගේ අදහස් එකහෙළා බැහැර නොකර, ඒවා පිළිබඳ ව කල්පනා සිත්හි දරා ගෙන, සිංහල සංස්කෘතියට නව මුහුණුවරක් දීමට අපේ සරසවි ඇදුරන් උත්සාහවන්ත වූ බව ප්‍රකාශ කිරීමට ය.

මේ කරුණුවලට අමතර ව විශ්වවිද්‍යාල ආචාර්යවරුන් විසින් භාෂාව, සාහිත්‍යය, ඉතිහාසය, පුරාවිද්‍යාව හා නොයෙකුත් විද්‍යා විෂයයන් ආදියට සිදු කළ සේවාවන් ගැන යම්බඳු සඳහනක් කළ යුතු වෙයි. මේ කරුණු ප්‍රකාශ කිරීමේ දී විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් අතින් පවා වැදගත් කාර්යභාරයක් ඉටු වූ බව අමතක නොකළ යුතුය. සිංහල, ඉංග්‍රීසි, දෙමළ, හින්දි ආදී භාෂාවලින් ලියැවී මුද්‍රණය වූ නවකථා, කෙටිකථා, කාව්‍ය රචනා, නාට්‍ය ග්‍රන්ථ මෙන්ම ව්‍යාකරණ, ශබ්දකෝෂ, විශ්වකෝෂ සහ උද්භිද, රසායන, භෞතික, සත්ත්ව, ජීව, වෛද්‍ය, ඉංජිනේරු, ගණිත ආදී විෂයයන් අළලා රචිත ග්‍රන්ථ රාශිය විමර්ශනයට ලක් කරන කල, අපේ විශ්වවිද්‍යාලවලින් ඉතා වටිනා සේවයක් සිදු වී ඇති බව ආඩම්බරයෙන් පැවසිය හැකිය. මෙම පර්යේෂණ කටයුතු සාර්ථක කිරීමෙහිලා පුරෝගාමී ව වැඩ කළ සෙනරත් පරණවිතාන, ජී.පී. මලලසේකර, ඩී.ඊ. හෙට්ටිආරච්චි, විමලානන්ද තෙන්නකෝන් ආදී මහාචාර්යවරුන්ගේ නාමයන් මෙබඳු අවස්ථාවක දී ගෞරවාදර සහිත ව සඳහන් කළ යුතු ය.

විශ්වවිද්‍යාලවලට හිසරදයක් වශයෙන් අඛණ්ඩ ව පවත්වා ගෙන යනු ලබන නවක වදය නමැති සංවේගජනක ක්‍රියාවලිය ගැන ද යමක්

සඳහන් නොකළේ නම් බලවත් අඩුපාඩුවකි. විශ්වවිද්‍යාලවලට අභිනවයෙන් ඇතුළත් වන සිසුන් හඳුනා ගැනීමේ උපායක් වශයෙන් මෙය පටන් ගනු ලැබුවත් එය ක්‍රමයෙන් ඉතා බිහිසුණු අවස්ථා දක්වා දියුණු වී ඇත. මුලින් ම මෙය ඇරඹුණේ ශිෂ්‍යයකු මේසයක් මත නංවා නිරුවතින් සිටුවීමෙනි. විශ්වවිද්‍යාල නවක වදය පිළිබඳ ව නවසිය පණස් ගණන්වල දී ලංකා පාර්ලිමේන්තුවේ සාකච්ඡාවක් ඇති වූ අවස්ථාවක දී එකල එහි මන්ත්‍රීවරයකු ව සිටි ඒ. අමිර්තලිංගම් මහතා කළ ප්‍රකාශයක් මෙහි දී සිහිපත් කිරීම සුදුසු යයි සිතමි. එතුමා ප්‍රකාශ කළේ "නවකයෙකු වශයෙන් මා විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ විට අනෙකුත් නවකයන් පීඩාවට ලක් වූ නමුත්, එකල සිටි ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් මා ළඟට කිට්ටු වූයේවත් නැත. මන්ද, මගේ නිරුවත දැකීමට ඔවුන් මහත් සේ භය වූ නිසාය."

විශ්වවිද්‍යාලවලින් පටන්ගත් මේ ක්‍රියාවලිය, අනෙකුත් තරුපහේ පාසල්වලට ද, මෙකල ගම්බද පාසල්වලට ද බෝවී ඇති රෝගයකි. එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ් සරසවිවලට ඉගෙනීමේ කටයුතු සඳහා ගිය අය ද එකල නවක වදයට පාත්‍ර වූ බව දැනගන්ට ලැබී ඇත. ක්‍රමයෙන් වෙනස්කම්වලට භාජනය වූ මේ දුසිරිත ලංකාවේ සරසවිවලට ද සංක්‍රමණය වී වැඩිකල් නොගොස් අතිශය දරුණු වධහිංසා ආදියට තුඩු දුන් තත්ත්වයකට පෙරළුණි. එක්තරා විශ්වවිද්‍යාලයකට අභිනවයෙන් ඇතුළත් වූ යුවතියක් තට්ටු දෙකක් මත සිට ජනේලයෙන් පහතට පැන්නේ එම දුශ්චරිත අතිශය දරුණු අමනුෂ්‍ය තත්ත්වයකට පත් වීමේ හේතුවෙනි. සමහර අවස්ථාවල දී දරුවන්ගේ ආරක්ෂාවට ගිය දෙමව්පියන්ට ද අමානුෂික හිරිහැරවලට භාජනය වීමට සිදු විය. ප්‍රශ්නය උග්‍රවත් ම, ශිෂ්‍ය පිරිස් අතරේ ගැටුම් ඇති විය. ඒවා සංසිඳවීමට පැමිණි පොලීසියට ද ආචාර්යවරුන්ට ද නවක වදය දීමට ඇතැම් ශිෂ්‍යයෝ පෙළඹී ගියාහු ය. ප්‍රශ්නයේ බරපතලකම නිසා නවක වදය නීතියෙන් තහනම් කිරීමට පවා සිදු විය. ඒ සමග ම නොයෙක් ආකාරයේ නවකවද රට පුරා පටන්ගත් බව වාර්තා වී ඇත. ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලයෙන් පිට වී ගොස් රැකියාවල යෙදී සිටින අතරතුර, නවකවදය කාලයට යළිත් විශ්වවිද්‍යාල භූමියට පැමිණෙන්නේ නවකවදය දීමටය. කුමන ආගමක හෝ සමාජ තත්ත්වයක ජීවත් වන අය වුවත් මෙකී දුසිරිත් අතිශයින් පිළිකුල් කළ යුතුවා මෙන් ම ඒවාට රුකුල් දීමෙන් වැළකී සිටීමට යොමු විය යුතු ය.

විශ්වවිද්‍යාල අධ්‍යාපනය මගින් රටක ආර්ථික, සංස්කෘතික හා සමාජ දියුණුව සඳහා වැදගත් සේවයක් සිදු විය යුතුය. විද්‍යාඥයන්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, ගුරුවරුන්, කලාකරුවන්, භාෂා විශේෂඥයන්, දේශපාලනඥයන් බිහි කළ යුත්තේ විශ්වවිද්‍යාල මගිනි. රටක දියුණුව සඳහා අවශ්‍ය කරන විශේෂඥ ශ්‍රමය ඇති කරන්නේ මෙකී විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්‍රමය රටකට ගැළපෙන අයුරින් සකස් කර ගැනීමෙනි. අප හැම දෙනාගේ ම ආශාවක් වන්නේ අපේ රටේ



තිබෙන්නේ ලෝකයේ ඇති හොඳ ම විශ්වවිද්‍යාල බව ආඩම්බරයෙන් පැවසීමට ය. ජාතික වශයෙන් බලතහොත් සැප සම්පතින් ආඪ්‍ය වූ රාජ්‍යයක් ගොඩනගා ගැනීමේ කාර්යභාරය විශ්වවිද්‍යාලවලින් ඉගෙනීම ලබන සිසුන්ට අයත් ය.

1975 පමණ වන තුරු ලංකාවේ විශ්වවිද්‍යාලවල අරමුණ වූයේ විද්‍යා, කලා, වාණිජ, ඉංජිනේරු හා වෛද්‍ය උපාධිධාරීන් පමණක් බිහි කිරීමයි. මීට පසු ව මෙම අරමුණු තරමක් වෙනස් මුහුණුවරක් ගත් බව පෙනෙයි. දේශීය වෛද්‍ය පර්යේෂණ, ධීවර පර්යේෂණ, සාගර සම්පත් ගවේෂණය, තාක්ෂණ පර්යේෂණ, ආරක්ෂක විද්‍යාව, භාෂා ශාස්ත්‍ර, සංගීතය, ආගම් හා දර්ශනයන් පිළිබඳ අධ්‍යයන කටයුතු සඳහා වෙන ම අධ්‍යාපන ආයතන මින් පසු ව ඇතිවන්ට විය. විශ්වවිද්‍යාල අධ්‍යාපනය මෙසේ විවිධාංගීකරණය වීම උසස් ජයග්‍රහණයක් වශයෙන් සැලකිය යුතු වූවත්, 21වන ශතවර්ෂයේ ශීඝ්‍ර ආර්ථික දියුණුවක් කරා ගමන් කළ යුතු රටක් වශයෙන්, ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සම්බන්ධයෙන් අපට සෑහීමකට පත් විය හැකි ද?

කල්යත් ම, උපාධිධාරීන් සඳහා විරැකියාව වැඩිවීම හේතු කොට ගෙන, සරසවි පාලනය හා ඒවායේ විෂය මාලාවන් දැඩි විවේචනවලට භාජනය විය. කලකට පෙර අධ්‍යාපන ඇමති ව සිටි ඊරියගොල්ල මහතා මේ තත්ත්වය වෙනස් කිරීමට උත්සාහ ගත් නමුත් එකල බලපෑ දේශපාලන හේතු නිසා විශ්වවිද්‍යාල අධ්‍යාපන ප්‍රතිසංස්කරණය පසුබෑමකට ලක් විය.

ලංකාවේ ආර්ථික තත්ත්වය ඉතා වේගවත් අන්දමින් වෙනස්කම්වලට භාජන වෙමින් පවතින නිසා විශ්වවිද්‍යාලවලින් බිහිවන උපාධිධාරීන්ගේ ගුණාත්මක භාවය උසස් මට්ටමක පවත්වා ගැනීම ද අත්‍යවශ්‍ය කරුණකි. මෙකල ලංකාවේ පිහිටුවා ඇති විශ්වවිද්‍යාල ගණන 17ක් පමණ වුවත්, ඒවායේ ඉගැන්වීම සඳහා සුදුසුකම් ඇති ආචාර්යවරුන්ගේ සංඛ්‍යාව ඉතාමත් පහළ මට්ටමකින් පවතින බව ප්‍රකාශ කිරීමට සිදු ව ඇත්තේ කණගාටුවෙනි.

ඉතා දියුණු රටවල විශ්වවිද්‍යාල සඳහා අරමුදල් සැපයීමේ දී රජය විසින් සලකා බලනු ලබන ප්‍රධාන නිර්ණායකය වන්නේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු ය. ඒ නිසා එම රටවල ආචාර්යවරුන්ට තමන්ගේ වැටුප පමණක් රැගෙන ජාතික සම්පත් දියුණු කිරීමේ කාර්යයන්හි නිරත නොවී සිටීම උගහටය. එම ආචාර්යවරුන්ගේ සේවා ගිවිසුම් කාලයෙන් කාලයට අලුත් කිරීමේ දී සලකා බලන්නේ යම් යම් ඇගැයුම් කිරීමෙන් පසුවය. මෙම ඇගැයුම්වල දී ප්‍රධාන වශයෙන් අවධානයට ලක් වනුයේ ඉගැන්වීමේ කටයුතුවලට වඩා තම තමන් කළ පර්යේෂණ හා ප්‍රකාශන පිළිබඳ සාක්ෂ්‍යය. මෙකී රටවල සමහර ආචාර්යවරුන් තමන්ගේ දෙවන හෝ තුන්වන සේවා ගිවිසුම් ලබා ගැනීමට අපොහොසත් වන්නේ එබඳු සාක්ෂ්‍යයන් ඉදිරිපත් කිරීමට නොහැකි හෙයිනි. එහෙයින් අලසයන්ට එම විශ්වවිද්‍යාලවල ස්ථිර වශයෙන් රැඳී සිටීමේ අවකාශ නොමැත.

මෙහි දී සඳහන් නොකර සිටීමට අපහසු කාරණයක් නම් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් කෙරෙහි බලපවත්වන දේශපාලන වාතාවරණයයි.

යම් යම් දේශපාලන පක්ෂවලට ශිෂ්‍යයන් බැඳවා ගැනීමේ හේතුවෙන් ශිෂ්‍ය පිරිස් අතර අසමගිකම් මෙන් ම අරගල පවා ඇති වූ බව අපි දනිමු. කිසියම් දේශපාලන පක්ෂයක ම ශිෂ්‍යයෙකු බැඳෙන්නේ හෝ බඳවා ගනු ලබන්නේ එම පක්ෂයේ ක්‍රියාකාරකම් පිළිබඳ ව මනා අවබෝධයකින් නො වේ. දේශපාලන විද්‍යාව හරි හැටි නොදත්කම, දේශපාලනඥයන්ගේ බලපෑම්, වැඩිහිටි සිසුන්ගේ හෝ විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසන් කර රැකියාවල යෙදී සිටින පැරණි සිසුන්ගේ බලපෑම් ආදිය නිසා මෙම කණගාටුදායක අවස්ථාවන් ඇති වී තිබෙන බව සඳහන් කළ යුතුමය. ලංකා විශ්වවිද්‍යාලයේ ප්‍රථම උප කුලපතිවරයා වූ සර් අයිවර් ජෙනිංග්ස් මහතා රාජනීතිඥවරයකු මෙන් ම ආණ්ඩුක්‍රම විෂය පිළිබඳ මහාචාර්යවරයෙකි. එක් අවස්ථාවක දී තමන් හමුවට පැමිණි ශිෂ්‍යයෙකු එතුමා විසින් ඉතා ගැඹුරින් පරීක්ෂා කර බලන ලදි. එම ශිෂ්‍යයා ලංකාවේ එකල ප්‍රබල දේශපාලන පක්ෂයකට සම්බන්ධ වූ අයෙකි. ජෙනිංග්ස් මහතාගේ පරීක්ෂණය අවසන් වූ කල්හි එතුමා විසින් ප්‍රකාශයක් නිකුත් කරන ලදි. එය එක්තරා සභාවක දී විශ්වවිද්‍යාලය ඇතුළත දීම කරන ලද්දකි. එතුමා කියා සිටියේ එම ශිෂ්‍යයා ඔහු සම්බන්ධ වී සිටි පක්ෂයට අයත් නොවූ බවත්, ඔහුගේ නියම දේශපාලන අදහස්, එංගලන්තයේ කලකට පෙර අගමැති ව සිටි විලියම් ග්ලැඩ්ස්ටන් හා සම්බන්ධ ලිබරල් පක්ෂයට (Gladstonian Liperal) ගැළපෙන බවත් ය. මෙයින් කියවන්නේ බොහෝ දෙනා තමන් කරන දේ කුමක් දැයි තමන් ම නොදන්නා බවය.

අපේ රටේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා ඇති පහසුකම් එතරම් ශුභ තත්ත්වයකින් යුතු බව කීම අපහසුය. අලුතින් අරඹන ලද විශ්වවිද්‍යාලවල පන්ති කාමර, විද්‍යාගාර හා නවාතැන් පහසුකම් ආදිය අඩු බව පෙනේ. ශිෂ්‍යයන්ගේ ගතිපැවතුම් මෙන් ම ඔවුන් ලබාගන්නා අධ්‍යාපනය ඔවුන්ට හා රටට ප්‍රයෝජනවත් අයුරින් යොදා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම අවශ්‍ය ප්‍රතිපාදන සම්පාදනාදිය තව ම සිදු වී නැත.

ලංකාවේ විශ්වවිද්‍යාලවලින් උගත් බොහෝ පිරිසක් වෙනත් රටවලට සංක්‍රමණය වී ඇති හෙයින් ඒ තත්ත්වය ලංකාවට සිදු වූ හා සිදු වන බලවත් පාඩුවක් වශයෙන් සැලකිය යුතුය. මේ අයගෙන් වැඩි පිරිසක් පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වී ආපසු නොපැමිණි පිරිසයි. මේ තත්ත්වයන් ඇති වීමට හේතුව කුමක් ද? මේ රටේ සිට විදේශයකට ගිය විට එහි දී වඩා හොඳ සමාජ පරිසරයකට, රැකීරක්ෂා ලාභයකට, තම දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක ලෙස නිමාවට පත් කර ගැනීමට පහසුකම් ලැබීම ආදී කරුණු මේ සඳහා බලපාන බව කිව හැකියි. මේ කරුණු හැරෙන්නට තවත් හේතු කිහිපයක් තිබෙන්නට පිළිවන. ඒවා සොයා බලා ඒවාට නිසි පිළියම් යෙදීම මේ රටේ දේශපාලකයන් සතු වගකීමකි.



මෑත කාලයේ දී පිහිටුවන ලද විශ්වවිද්‍යාලවල ප්‍රගතිය පිළිබඳ ව යම් යම් අය විසින් මති මතාන්තර පහළ කර ඇති බව පෙනේ. විශ්වවිද්‍යාල අධ්‍යාපනය රටේ නොයෙකුත් ප්‍රදේශවල ව්‍යාප්ත කළ යුතු බවට විවාදයක් නොමැත. අධ්‍යාපන තත්ත්වයන් උසස් කරලීම සඳහා අවශ්‍ය මුදල් ලබා ගැනීමේ දුෂ්කරතා, අධ්‍යාපන කටයුතු සාර්ථක ලෙස කර ගෙන යාමට ඇති නොයෙකුත් අවහිරකම්, ඒවා ඉවත් කර ගත හැකි අයුරින් පීඨ මණ්ඩල සකස් කර ගැනීම සහ උපාධිධරයන්ට රැකීරක්ෂා සපයා ගත හැකි අයුරින් පාඨමාලා පිළියෙල කිරීම යනාදී කරුණු ගැන අවධානය යොමු කළ යුතු ව ඇත. එසේ වුවත් අප විසින් සිහියේ තබාගත යුතු කරුණක් නම්, ලෝකයේ අනෙක් විශ්වවිද්‍යාලවල ඉගෙනීම ලබන අයගේ සංඛ්‍යාව හා අප රටේ ශිෂ්‍ය සංඛ්‍යාව සමඟ සමාන කර බැලුවහොත් දෙපිල අතර ඇති පරතරය ඉතා ම පහත් තත්ත්වයක පවත්නා බවයි. එසේ වුවත් අප රටේ ජීවත් වන වැඩිහිටියන්ගෙන් සියයට අනුවක් ම දැන උගත්කම් සහිත අය බව සිහියට නගමු. එසේ නම් අපේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන ශිෂ්‍ය සංඛ්‍යාව ගැන අපට සෑහීමකට පත් විය හැකිද? අභිනව පාඨමාලා සකස් කිරීමේ දී විශ්වවිද්‍යාල බලධාරීන් විසින් සැලකීමට ගත යුතු කරුණක් නම් ඒවා ඉගැන්වීම සඳහා සුදුසුකම් ඇති ආචාර්යවරුන් සොයාගත හැකි ද යනුයි.

අද දින උපාධි ලබා ලෝකයට පිවිසෙන තරුණ පිරිසගේ අවධානයට යොමු විය යුතු කරුණු කිහිපයක් අවසාන වශයෙන් මතක් කරනු කැමැත්තෙමි. විශ්වවිද්‍යාලයෙන් ලැබූ අධ්‍යාපනය හේතු කොටගෙන තමන් වැඩිහිටි ලෝකයට පිවිසෙන්නේ ආත්ම විශ්වාසයකින් හා ධෛර්යයකින් ද? අවශ්‍ය සුදුසුකම් සහිත ව තමන් රැකීරක්ෂා ලෝකයට පා තබන්නේ ද? තමන් ලැබූ අධ්‍යාපනය තමන්ට ප්‍රයෝජනවත් එකක් වී ද? ලෝකයට ප්‍රවේශ වූ කල්හි තමන් කරා එන අභියෝගවලට මුහුණ දීමට ආත්ම ශක්තිය තමන්ට ඇති ද? පරාජයක් ලැබූ කල්හි එය සිනා මුහුණින් පිළිගැනීමේ ශූර භාවයක් තමන්ට ඇති ද? මෙකී කරුණු ගැන සිහිකල්පනාවෙන් යුතු ව සිටීම ප්‍රඥාගෝචර වෙයි.

විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ මූලික පරමාර්ථය වනුයේ එහි ඉගෙනීම ලැබූ ශිෂ්‍යයන්, රටට අවශ්‍ය කරන තරුණ පිරිස් වශයෙන් බිහි කිරීමයි. ඉහතින් සඳහන් කළ ප්‍රශ්නවලට පිළිතුරු ලැබෙනුයේ විශ්වවිද්‍යාලය මගින් ශිෂ්‍යයන්ට දායාද කළ අධ්‍යාපනය මගිනි. ශිෂ්‍යයන් අනුගමනය කළ පාඨමාලාවලින් පමණක් නොව විශ්වවිද්‍යාලය ඇතුළත තිබුණු ශාස්ත්‍රීය හා බුද්ධිමය පරිසරය ද මීට අවශ්‍යයෙන් ම හේතුභූත විය යුතුය. අපේ විශ්වවිද්‍යාලවලින් බිහිවිය යුත්තේ රටට, ජාතියට සේවාවක් කළ හැකි අභීත තරුණ පිරිසකි.